## අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය

### පුරප්පාඩු

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරු වල පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 1. අධ්‍යක්ෂ - මූල්‍ය - **( HM 1-1)** | **01** |

01. **තනතුරු නාමය - අධ්‍යක්ෂ මූල්‍ය**
**සේවා ගණය - ජ්‍යෙෂ්ඨ කළමනාකාර - (HM 1-1)**
**පුරප්පාඩු ගණන - 01**

**1.1 සුදුසුකම් :**

**1.1.1 බාහිර අයදුම්කරුවන් (පහත සඳහන් 01 හෝ 02)**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, මූල්‍ය/ ගිණුම්කරණය/ වාණිජවේදී යන විෂයය ක්ෂේත්‍රයකින් උපාධියක් ලබා තිබීම;

*හෝ*

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණය ආයතනයේ සාමාජිකත්වය ලබාතිබීම හෝ එක්සත් රාජධානියේ වරලත් කළමනාකරණ ගණකාධිකාරි ආයතනයේ (CIMA) සාමාජිකත්වය ලබා තිබීම හෝ වරලත් සහතිකලත් ගණකාධිකාරි ආයතනයේ (ACCA) සාමාජිකත්වය ලබා තිබීම.

*සමග*

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයට ගැළපෙන්නා වූ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

*සහ*

ඉහත සඳහන් ප්‍රථම උපාධි සුදුසුකම් ලබා ගැනීමෙන් පසුව රජයේ හෝ රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ඩලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකරණ මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13 (දහතුනක) පළපුරුද්දක් තිබීම.

02. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ පූර්ණ සාමාජිකත්වය;

*සහ*

රජයේ, රාජ්‍ය සංස්ථාවක/ ව්‍යවස්ථාපිත ආයතනයක/ මණ්ලයක/ දෙපාර්තමේන්තුවක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක කළමනාකාර මට්ටමේ (MM 1-1) තනතුරක අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර 13 ක පළපුරුද්දක් තිබීම.

**1.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන්**

ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

*හෝ*

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයෙහි මධ්‍යම කළමනාකරණ සේවා ගණයෙහි සේවා ගණයෙහි (MM 1-1) I වන ශ්‍රේණියේ අවම වශයෙන් වසර 3ක (තුන) අදාළ විෂයය ක්ෂේත්‍රයේ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

*සමග*

අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු වේ.

**1.2 වයස:**

**අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.**

**1.3.** වැටුප් කේත අංකය **-** HM 1-1
**1.4. මාසික වැටුප් පරිමාණය -**
(HM 1-1 ක.ච. 01/2025 (රු. 140,640 - 15 x 4,100 - රු. 202,140/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමි වේ.)

***සැ. යු.*** මෙයට අමතරව නිල වාහන හිමිකාරිත්වය ලබන අතර රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ 1/2015 (i) හා (ii) ප්‍රකාරව ඉන්ධන දීමනාව හා මෙයට අමතරව සන්නිවේදන දීමනා PED 2/2022 චක්‍රලේඛය අනුව හා වෘත්තීය දීමනාව ක. චක්‍රලේඛ 01/2025 අනුව ලබා දේ.

මෙම තනතුරු සඳහා පොදු කරුණු :

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු යි.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.**

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍ය

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන www.nddcb.gov.lk වෙත පිවිස, "**වෘත්තීන්**" (https://www.nddcb.gov.lk/sinhala/careers.php) හි දක්වා ඇති උපදෙස් පරිදි අයදුම්පත සම්පූර්ණ කර **Submit Application** කිරීමෙන් අනතුරුව එහි පිටපත බාගත කර, එම දැඩ පිටපතට මුදල් ගෙවූ රිසිට්පතෙහි මුල් පිටපත අමුණා ලියාපදිංචි තැපැල ඔස්සේ යොමු කළ යුතු ය.

බඳවා ගැනීමේ ක්‍රමවේදය

බඳවා ගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

පත්වීමේ ස්වභාවය

ස්ථිර, සේවක අර්ථසාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත ය.

අයදුම්පත් ගාස්තුව

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමින් ලංකා බැංකුවේ කෝපරේට් ශාඛාවේ (Corporate Branch) අංක 00001643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපත (Deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතු ය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

බාගත කරන ලද අයදුම්පත (කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමග **2026.10.23** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපැලෙන් "සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය" යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් යොමු කළ යුතු ය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් / අසම්පූර්ණ අයදුම්පත්/ මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත්/ බාගත (Download) කරන ලද අයදුම්පත හැර යොමු කරන ලද වෙනත් අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.**

**සභාපති,**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.**

**ප්‍රකාශිත දිනය : 2026 ඔක්තෝබර් මස 02 වැනි දින,**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ,**
**383, කෝට්ටේ පාර,**
**රාජගිරිය.**

10 - 410